







ශ්‍රී ලංකාවේ මුල්ම මෝටර් රථ තාක්‍ෂණ සඟරාව මෝටර්රථ නමින් 1995 ජනවාරි මස සිට ප්‍රකාශයට පත්වීම ආරම්භ වූ අතර කලාප 20 කින් අවසන් කරන ලදී. මෙය උසස් මෝටර් රථ තාක්‍ෂණය සඳහා වෙන් වූවකි.

මෝටර්රථ ආදර්ශ කලාප දෙකක්









උසස් මෝටර් රථ තාක්‍ෂණය සඳහා මෝටර්රථ සඟරාව නිකුත් වීමත් සමඟ පාඨක ඉල්ලීම මත සාමාන්‍ය මෝටර් රථ තාක්‍ෂණය සඳහාද සඟරාවක් 1996 මාර්තු මස සිට ප්‍රකාශයට පත් කරන ලදී එය නම් කෙරුණේ සිප්රථ නමිනි.

සිප්රථ ආදර්ශ කලාප දෙකක්




දමුතු තාක්‍ෂණ ප්‍රකාශන ආයතනය ලක්හඬ ගුවන් විදුලිය හා එක්ව ප්‍රකාශයට පත්කල ලක්හඬ රියසකි වැඩසටහන හා සම්බන්ධව රියසකි යන සඟරාව ප්‍රකාශයට පත් කෙරුනි. එය කලාප 50 කට පසු නතර කරනු ලැබුවේ මෙම වෙබ් අඩවිය සකස් කිරීම සඳහාය. ඉදිරියේදී නැවතත් මෙම සඟරාව වෙනත් ආරෙකින් මෙන්ම වෙනත් නමකින් නැවතත් ආරම්භ වනු ඇත.

රියසකි ආදර්ශ කලාප දෙකක්

**මෙම වෙබ් පිටුව සකසා ඇත්තේ රියසකි මාසික සඟරාවේ පළවූ ට්‍රැක්ෂන් කොන්ට්‍රෝල් වර්ග පිළිබඳව වූ ලිපි පෙළ ඇසුරිනි.**

# වෙහිකල් ස්ටැබිලිටි කොන්ට්‍රෝල් VSC




ඕවර් ස්ටියරින් සහ අන්ඩර් ස්ටියරින් සිදුවන අයුරු

රථයක් වංගුවක් ගැනීමේදි රියදුරු සුක්කානම හරවනු ලබන්නේ වංගුවට සරිලන ප්‍රමාණයට ඉතා නිවරැදිව වුවත් රථය එම මාර්ග පථයේ ගමන් කරන්නේ එහි වේගය ඉතා අඩු නම් පමණි. වේගය වැඩිවන විට ඉහත සටහන අයුරු රථය එම පථයෙන් ඉවත්ව ඕවර් ස්ටියරින් හෝ අන්ඩර් ස්ටියරින් තත්වයට පත්වෙයි. එහිදි රියදුරු විසින් නැවත සුක්කානම සහ බ්‍රේක් භාවිතාකර එය නියමිත පථයට ගත යුතුවෙයි. එහෙත් VSC ඇත්නම් ඇත්නම් එම කාර්යය රථයේ පාලන ඒකකය මගින්ම සිදුවෙයි. ඒ බුල්ඩෝසර් හරවන ආකාරයට නියමිත රෝදය බ්‍රේක් පද්ධතිය මගින් සිර කිරීමෙනි.

මෙම VSC පද්ධතිය මෝටර් රථ වර්ග ගණනාවකම යොදා ගන්නා අතර එය මුලින්ම යොදා ගැනුනේ ජර්මන් රථවලය. එහිදි ඔවුන් එය හඳුන්වනු ලැබේවේ ESP (Electronic Stability Control) නමිනි. එහෙත් එය මීළඟට යොදා ගත් ප්‍රංශ සහ ඉතාලි වැනි රටවල නිෂ්පාදනයන් වල මෙය හඳුන්වනු ලැබුවේ, **ASMS** (Automotive Stability Mangement System),**DDC** (Driving Dynamic Control), **DSC** (Dynamic Stability Control) **VSA** (Vehicle Stability Assist) වැනි නම් වලිනි. ඒ අනුව මෙය අවසානයට යොදා ගත් ජපන් මෝටර් රථවල මෙම පද්ධතිය VSC (Vehicle Stability Control) නමින් හඳුන්වා දි තිබෙයි.

ESP පද්ධතිය අපි රියසකි 21 සිට 24 දක්වා කලාප තුලින් කොටස් වශයෙන් ඉතා ගැඹුරින් අධ්‍යයනය කලෙමු. මෙම VSC පද්ධතියද තනිකරම ක්‍රියාකරන්නේ එම ESP ක්‍රියාකරන ආකාරයටම කිසිදු වෙනසක් නොමැතිව බැවින් ඒ පිළිබඳව නැවත මෙහි විස්තර නොකෙරේ. මේ අතර විවිධ නම් වලින් ට්‍රැක්ෂන් කොන්ට්‍රෝල් පද්ධති ඔබට නවින රථවල දැකිය හැකි නමුත් ඒවායේ මුල් පද්ධති රියසකි කලාප තුල අතරින් පතර පළවී ඇති බවද මෙහිදි සඳහන් කලයුතුව ඇත.